සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2025 ජනවාරි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

2025-02-01
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයකම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

## වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක **1.1** සිට **1.5** දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** **සීමාසහිත AB සමාගමේ** 2024 මාර්තු 31 දිනට, පිරිවැය රු.8,450,000/- ක් වූ අවසන් තොගය කල් ඉකුත්වී ඇති අතර, එය 2024 අප්‍රේල් මාසයේදී රු.6,000,000/- කට විකුණන ලදී. සමාගම විසින් මේ සඳහා විකුණුම් අගය මත 20% ක විකුණුම් කොමිස් මුදලක් ගෙවන ලදී. 2024 මාර්තු 31 දිනට මෙම තොගයේ ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] වූයේ:

(1) රු.8,450,000/-. (2) රු.6,760,000/-. (3) රු.4,800,000/-. (4) රු.6,000,000/-.

(ලකුණු 02)

**1.2** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන්, පිරිවැය ගිණුම්කරණය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) එය සමස්ත ව්‍යාපාරයේම ගනුදෙනු ආවරණය කරයි.

(2) අරමුණ අනුව, පිරිවැය, සෘජු පිරිවැය සහ වක්‍ර පිරිවැය ලෙස බෙදා දැක්විය හැකිය.

(3) පිරිවැය ගිණුම්කරණයේදී ඓතිහාසික ගනුදෙනු පමණක් භාවිත කෙරේ.

(4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** කුමක් ද?

(1) ප්‍රාග්ධනය සඳහා සමානව දායක වීමට හවුල්කරුවන්ට හිමිකමක් පවතී.

(2) හවුල් ව්‍යාපාරයේ කටයුතු වෙනුවෙන් ඔවුන් දරණ ලද වියදම් ප්‍රතිපූරණය කර ගැනීමට හවුල්කරුවන්ට හිමිකමක් පවතී.

(3) හඳුන්වා දුන් ප්‍රාග්ධනය සඳහා පොලියක් ලබාගැනීමට හවුල්කරුවන්ට හිමිකමක් පවතී.

(4) ලාභ හෝ අලාභ හවුල්කරුවන් අතර සමානව බෙදාගත යුතුය.

(ලකුණු 02)

**1.4** පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

**(a)** කාණ්ඩ පිරිවැයකරණය (batch costing), විශේෂිත ඇණවුම් පිරිවැයකරණ ක්‍රමයක් වේ.

**(b)** පාන් නිෂ්පාදකයෙකු සඳහා කාර්යය පිරිවැයකරණය (job costing) යෝග්‍ය වේ.

**(c)** - පෙරසැරි පිරිවැයකරණයට (process costing) අඛණ්ඩ මෙහෙයුම් පිරිවැයක් පවතී.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන්, නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ තෝරන්න:

(1) **(c)** පමණි. (2) **(a)** සහ **(b)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

**1.5** **සීමාසහිත Colombo Properties (පෞද්ගලික) සමාගම,** මහල් නිවාස කිහිපයකින් කුලී ආදායම් ලබයි. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී ලැබුණු මුළු බදු කුලිය රු.962,400/- කි.

**සීමාසහිත Colombo Properties (පෞද්ගලික) සමාගම** සඳහා පහත සඳහන් තොරතුරු සපයා ඇත:

| **විස්තරය** | **2023 අප්‍රේල් 01 දිනට (රු.)** | **2024 මාර්තු 31 දිනට (රු.)** |
|---|---|---|
| ඉදිරියට ලද බදු කුලී | 57,400 | 62,400 |
| හිඟ බදු කුලී | 42,400 | 36,800 |

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කුලී ආදායම වනුයේ:

(1) රු.973,000/-. (2) රු.951,800/-. (3) රු.921,800/-. (4) රු.1,046,600/-.

(ලකුණු 02)

*අංක **1.6** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.6** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 10 - වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිදුවීම් ප්‍රමිතයට අනුව, සමාගමක ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු නොගලපන සිද්ධීන් (non-adjusting events) සඳහා උදාහරණ දෙකක්(02) හඳුනා දක්වන්න. (ලකුණු 02)

**1.7** ආර්ථික ඇණවුම් ප්‍රමාණ [Economic Order Quantity (EOQ)] සූත්‍රයේ උපකල්පන තුනක්(03) සඳහන් කරන්න.

(ලකුණු 03)

**1.8** **X** සහ **Y** යනු පිළිවෙලින් ලාභා'ලාභ 3:2 අනුපාතයට බෙදාගන්නා හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෝ වෙති. 2023 අප්‍රේල් 01 දින, **Z** නව හවුල්කරුවෙකු ලෙස සම්බන්ධ වූ අතර, **X, Y** සහ **Z** අතර, ලාභා'ලාභ බෙදාගැනීමේ අනුපාතය පිළිවෙලින් 4 : 3 : 3 වේ.

**X** සහ **Y** ගේ කැපකළ අනුපාතය (sacrificing ratio) ගණනය කරන්න. (ලකුණු 03)

1.9 පහත සඳහන් තොරතුරු, 2024 දෙසැම්බර් මාසය සඳහා **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමේ** ගිණුම් පොත්වලින් උපුටාගන්නා ලදී:

| | රු. |
|---|---|
| මූලික වැටුප | 4,675,000 |
| අතිකාල (overtime) | 850,750 |
| අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද [Advance Personal Income Tax (APIT)] | 225,000 |
| ණය සහ අත්තිකාරම් මත වැටුප් අඩු කිරීම් | 425,000 |

සේවක අර්ථසාධක අරමුදල [Employees' Provident Fund (EPF)] සඳහා සේවකයින් 8% ක දායකත්වයක් සහ සේවායෝජකයා 12% ක දායකත්වයක් ලබා දෙයි. තවද, සේවායෝජකයා විසින් සේවක භාර අරමුදලට [Employees Trust Fund (ETF)] 3% ක දායකත්වයක් ලබා දෙයි. සේවකයින්ගේ මූලික වැටුප මත සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට දායකත්වය සපයනු ලැබේ.

**සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම** විසින් 2024 දෙසැම්බර් මාසය සඳහා ගෙවිය යුතු ශුද්ධ වැටුප ගණනය කරන්න. (ලකුණු 03)

1.10 **සීමාසහිත XYZ සමාගම,** නිෂ්පාදකයෙකු වන අතර, පහත සඳහන් තොරතුරු 2024 දෙසැම්බර් මාසයේ අවසන් සතිය සඳහා සමාගමේ සේවකයෙකුට අදාල වේ:

| | |
|---|---|
| දිනක සාමාන්‍ය වැඩකරන පැය ගණන | පැය 8 කි (සතියකට වැඩකරන දින 5 කි) |
| පැයක් සඳහා මූලික ගෙවීම | රු.300/- |
| එක් ඒකකයක් නිම කිරීම සඳහා ගතවන සම්මත කාලය | මිනිත්තු 20 |
| මූලික ප්‍රසාද දීමනාව | මූලික පැයකට අදාල අනුපාතය මත ඉතිරිකල කාලයෙන් 70% |
| සත්‍ය නිමැවුම | ඒකක 210 |

2024 දෙසැම්බර් මාසයේ අවසන් සතිය සඳහා ඉහත සේවකයාගේ මුළු ඉපැයීම ගණනය කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

## 02 වන ප්‍රශ්නය

**ලලිත්** විසින් මුදලින් රු.2,000,000/- ක් සහ රු.10,000,000/- ක් වටිනා වාහන පහක් ආයෝජනය කරමින් **"ලලි කාර්"** නමින් ව්‍යාපාරයක් *(කේවලස්වාමි ව්‍යාපාරයක්)* 2022 අප්‍රේල් 01 දින ආරම්භ කරන ලදී. ව්‍යාපාරය විසින් කුලී පදනම මත වාහන සැපයීමේ යෙදී සිටී.

**ලලි කාර්** හි අනෙකුත් වත්කම් සහ වගකීම් පහත සඳහන් පරිදි වේ: *(රු.)*

| | 2024 මාර්තු 31 දිනට | 2023 මාර්තු 31 දිනට |
|---|---|---|
| ලී බඩු සහ උපකරණ - ධාරණ අගයට | 225,000 | 300,000 |
| තොගය - ඉන්ධන | 25,500 | 32,400 |
| මුදල් සහ බැංකු ශේෂ | ? | 1,825,000 |
| වෙළෙඳ ණයහිමියෝ (ඉන්ධන මිලට ගැනීම මත) | 230,000 | 250,000 |
| උපචිත විදුලිය සහ ජලය | 12,500 | 14,000 |

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් අතිරේක තොරතුරුද සපයා ඇත:

(1) ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු, කුලී ගොඩනැගිල්ලක සිදුකරන අතර, කුලී ගිවිසුමට අනුව මාසික ගොඩනැගිලි කුලිය රු.150,000/- ක් වේ. වර්ෂය සඳහා අදාල කුලිය, වර්ෂය තුළදී ගෙවා ඇත.

(2) **ලලි කාර්** පහත සඳහන් ගාස්තු කාණ්ඩ දෙකක් යටතේ ගමන් කළ කිලෝමීටර් (km) ගණන මත පදනම්ව පාරිභෝගිකයින්ට වාහන සපයනු ලබයි. සෑම ගමන් වාරයක් අවසානයේදී පාරිභෝගිකයින් විසින් ගාස්තුව මුදලින් ගෙවිය යුතු වේ:

| පාරිභෝගික කාණ්ඩය | කිලෝමීටරයක් සඳහා ගාස්තුව (රු.) |
|---|---|
| පෞද්ගලික | 150 |
| ආයතනික | 130 |

(3) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමෙන් (මුදල් පොතෙන්) පහත සඳහන් ගෙවීම් උපුටාගෙන ඇත:

| | රු. |
|---|---|
| ඉන්ධන මිලදී ගැනීම වෙනුවෙන් ණයහිමියන්ට කළ ගෙවීම් | 1,200,000 |
| කාර්යමණ්ඩල වැටුප් | 2,560,000 |
| විදුලිය සහ ජලය | 128,000 |
| වාහන නඩත්තු වියදම් | 400,000 |
| බැංකු ගාස්තු | 5,000 |
| කුලිය | 1,800,000 |

(4) වාර්තාවලට අනුව, **ලලි කාර්** වර්ෂය තුළදී පහත සඳහන් විකුණුම් පරිමාවන් ළඟා කරගෙන ඇත:

| පාරිභෝගික කාණ්ඩය | කිලෝමීටර් (km) ගණන |
|---|---|
| පෞද්ගලික | 25,000 |
| ආයතනික | 30,000 |

(5) වර්ෂය තුළදී, දේපළ, පිරියත සහ උපකරණ කිසිවක් මිලදී ගෙන නොමැත.

(6) පිරියත සහ උපකරණ, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු අතර, වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| මෝටර් වාහන | අවුරුදු 10 |
| ලී බඩු සහ උපකරණ | අවුරුදු 04 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(a) 2023 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන (ස්කන්ධය) ශේෂය. (ලකුණු 03)

(b) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යාපාරයේ ශුද්ධ ලාභය. (ලකුණු 07)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**සෝනියා, ඈන් සහ මායා,** 2024 ජනවාරි 01 දින පිළිවෙලින් හවුල්කරුවන් අතර ලාභා'ලාභ 2 : 2 : 1 අනුපාතයට බෙදා ගනිමින් **SAM හවුල්කරුවෝ** නමින් හවුල් ව්‍යාපාරයක් ලෙස, රූපලාවන්‍යාගාරයක් ආරම්භ කරන ලදී.

පහත සඳහන් තොරතුරු ද ඔබ වෙත සපයා ඇත:

(1) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු.1,540,000/- ක් විය.

(2) හවුල් ගිවිසුමේ පහත සඳහන් දෑ ඇතුලත් වේ:

- **ඇන්,** රු.70,000/- ක මාසික වැටුපක් ලැබීමට හිමිකම් ලබයි.
- 2024 ජනවාරි 01 දිනට පැවති ආරම්භක ප්‍රාග්ධන ගිණුම්වල ශේෂ මත හවුල්කරුවන්ට 5% ක පොලියක් හිමි වේ.

(3) පහත සඳහන් ශේෂයන් හවුල් ව්‍යාපාරයෙන් උපුටාගෙන ඇත: *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| 2024 ජනවාරි 01 දිනට ප්‍රාග්ධන ගිණුම් ශේෂය: | | |
| **සෝනියා** | | 3,000 |
| ඇන් | | 1,000 |
| **මායා** | | 2,000 |
| 2024 ජනවාරි 01 දිනට ජංගම ගිණුම් ශේෂය: | | |
| **සෝනියා** | | 500 |
| ඇන් | 300 | |
| **මායා** | | 800 |
| 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී සිදුකල ගැනිලි: | | |
| **සෝනියා** | 520 | |
| ඇන් | 280 | |

(4) 2024 දෙසැම්බර් 31 දින, **මායා,** හවුල් ව්‍යාපාරයෙන් ඉවත්වීමට තීරණය කළ අතර, **සෝනියා** සහ **ඇන්** එක්ව ලාභා'ලාභ සමානව බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය එම නමින්ම පවත්වාගෙන යාමට තීරණය කරන ලදී. **මායා** ට ගෙවිය යුතු සියලුම මුදල්, 2025 ජනවාරි 01 දින වන විට සම්පූර්ණයෙන්ම ගෙවා දැමිය යුතු විය.

(5) 2024 දෙසැම්බර් 31 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.1,000,000/- කට අගය කළ අතර, එය කීර්තිනාම ගිණුමක් පවත්වා ගැනීමකින් තොරව හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ගැලපිය යුතුය.

**ඔබ විසින් කල යුතු දෑ:**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, **SAM හවුල්කරුවෝ** හි පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 04)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

සාමාජිකයින් සඳහා ක්‍රිඩා කටයුතු සපයනු ලබන ක්‍රීඩා සමාජයක් වන **RAISE ක්‍රීඩා සමාජය,** 2015 දී ආරම්භ කරන ලදී. එක් සාමාජිකයෙකු සඳහා වාර්ෂික සාමාජික ගාස්තුව රු.2,000/- ක් වන අතර, 2024 ජනවාරි 01 දිනට සිටි සාමාජිකයින් ගණන 350 ක් වේ.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු ඔබ වෙත සපයා ඇත:

(1) සාමාජික ගාස්තු පිළිබඳ විස්තර පහත පරිදි වේ:

- සාමාජිකයින් 10 දෙනෙකු 2023 වර්ෂය සඳහා වන සාමාජික ගාස්තු 2024 තුළදී ගෙවා ඇත.
- සාමාජිකයින් 6 දෙනෙකු 2025 ට අදාල සාමාජික ගාස්තු 2024 තුලදී ගෙවා ඇත.
- සාමාජිකයින් 2 දෙනෙකු 2023 වර්ෂය තුළදී 2024 වර්ෂය සඳහා සාමාජික ගාස්තු ගෙවා ඇත.
- 2024 දෙසැම්බර් 31 දිනට, හිඟ සාමාජික ගාස්තු කිසිවක් නොමැත.

(2) **RAISE ක්‍රීඩා සමාජයේ** අනෙකුත් ලැබීම් සහ ගෙවීම්වල සාරාංශය පහත පරිදි වේ:

| | රු. |
|---|---:|
| **ලැබීම්:** | |
| පරිත්‍යාගය | 620,000 |
| තැන්පතු මත පොලිය | 50,500 |
| **ගෙවීම්:** | |
| පුහුණුකරුවන්ට කළ ගෙවීම් | 355,300 |
| ක්‍රීඩා උපකරණයක් මිලදී ගැනීම | 135,000 |
| වේතන | 369,000 |
| සංග්‍රහ වියදම් | 67,000 |
| විදුලිය | 53,000 |
| ක්‍රීඩාංගනයේ නඩත්තු වියදම් | 350,000 |
| ප්‍රචාරණය | 84,000 |

(3) 2024 ඔක්තෝම්බර් 01 දින, අළුත් ක්‍රීඩා උපකරණයක් මිලදී ගත් අතර, ක්‍රීඩා උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය වසර 5 ක් වේ. ක්‍රීඩා සමාජය, එහි ක්‍රීඩා උපකරණ, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. පැවති පැරණි ක්‍රීඩා උපකරණ සියල්ලම, 2024 ජනවාරි 01 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇත.

(4) 2024 සැප්තැම්බර් 01 දින, ක්‍රීඩා කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධානයකින් [Non-Government Organization (NGO)] රු.620,000/- ක විශේෂ පරිත්‍යාගයක් මුදලින් ලැබී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **RAISE ක්‍රීඩා සමාජයෙහි** පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) සාමාජික ගාස්තු ගිණුම. (ලකුණු 04)

(b) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(a) පහත සඳහන් තොරතුරු, **සීමාසහිත රවී සමාගමේ, කාර්යය අංක 102** ට අදාලව උපුටාගෙන ඇත:

| | |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | කිලෝ ග්‍රෑම් එකක් රු.750/- බැගින් කිලෝග්‍රෑම් 10,000 |
| සෘජු ශ්‍රමය | පැයකට රු.1,500/- බැගින් පැය 500 |
| නිෂ්පාදන පොදුකාර්ය | මූළු සෘජු ශ්‍රම පිරිවැයෙන් 150% |

සමාගම, නිෂ්පාදන පිරිවැය මත 25% ක ලාභයක් පවත්වා ගනී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**කාර්යය අංක 102** මත අයකළ යුතු මිල **ගණනය කරන්න.** (ලකුණු 03)

(b) **සීමාසහිත ලස්සන Clothing සමාගමේ** නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් **(P1 සහ P2)** සහ එක් සේවා දෙපාර්තමේන්තුවක් **(S1)** ඇත.

සමාගමේ 2025 මාර්තු මාසය සඳහා අයවැයගත නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය පහත පරිදි ඇස්තමේන්තු ගත කර ඇත:

| | රු. |
|---|---:|
| විදුලිය | 787,500 |
| කුලිය | 275,000 |
| සේවක සුභසාධනය | 303,000 |
| යන්ත්‍ර ක්ෂයවීම | 60,000 |

පහත සඳහන් අයවැයගත දත්ත, 2025 මාර්තු මාසයට අදාලව ලබා දී ඇත:

| | P1 | P2 | S1 | එකතුව |
|---|---|---|---|---|
| වක්‍ර ද්‍රව්‍ය (රු.) | 725,000 | 875,000 | 250,000 | 1,850,000 |
| සේවක සංඛ්‍යාව | 25 | 30 | 5 | 60 |
| යන්ත්‍ර පිරිවැය (රු.) | 10,000,000 | 12,000,000 | 8,000,000 | 30,000,000 |
| විදුලිය පරිභෝජනය (කිලෝවොට්) | 12,000 | 8,000 | 2,500 | 22,500 |
| භාවිත කරන ලද බිම් ප්‍රමාණය (වර්ග අඩි) | 2,500 | 2,300 | 200 | 5,000 |
| පිරිවැය විභජනය - **S1** | 65% | 35% | - | - |

**ඔබ විසින් කළ යුතු දෑ:**

එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය වෙන්කර විභජනය කරන්නේ කෙසේදැයි දැක්වෙන ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**. (ලකුණු 07)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(A) මෙට්ට නිෂ්පාදකයෙකු වන **සීමාසහිත ස්මිත් සමාගමේ, Q නිෂ්පාදිතය** සම්බන්ධ පහත සඳහන් තොරතුරු ඔබ වෙත සපයා ඇත:

| | |
|---|---|
| වාර්ෂික ඉල්ලුම | ඒකක 4,000 |
| ඒකකයක ගැනුම් මිල | රු.12,500/- |
| භාවිතය | ඒකක 400 - 900 |
| පොරොත්තු කාලය | මාස 2 - 4 |
| ඒකකයක් වාර්ෂික රඳවා ගැනීමේ පිරිවැය | ගැනුම් මිලෙන් 10% |
| ඇණවුම් කිරීමේ පිරිවැය | ඇණවුමක් සඳහා රු.506,250/- |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)]. (ලකුණු 02)

(b) යළි ඇණවුම් මට්ටම (Re-order Level). (ලකුණු 02)

(c) උපරිම තොග මට්ටම. (ලකුණු 02)

(B) 2024 අප්‍රේල් මාසය සඳහා **සීමාසහිත Wellington (පෞද්ගලික) සමාගමේ, "X"** අමුද්‍රව්‍යය සඳහා පහත සඳහන් තොරතුරු ලබා දෙනු ලැබේ:

| | |
|---|---|
| 2024 අප්‍රේල් 01 | ආරම්භක තොග ශේෂය - රු.12/- බැගින් ඒකක 500 |
| 2024 අප්‍රේල් 12 | රු.15/- බැගින් ඒකක 300 මිලදී ගැනීම |
| 2024 අප්‍රේල් 20 | ඒකක 400 ක් නිකුත් කරන ලදී |
| 2024 අප්‍රේල් 23 | රු.16/- බැගින් ඒකක 150 ක් මිලට ගැනීම |
| 2024 අප්‍රේල් 28 | ඒකක 250 ක් නිකුත් කරන ලදී |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් ක්‍රමය (FIFO) යටතේ 2024 අප්‍රේල් මාසයට අදාලව **"X"** අමුද්‍රව්‍ය සඳහා ගබඩා ලෙජරය **පිළියෙල කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත Everbright (පෞද්ගලික) සමාගමේ** 2024 මාර්තු 31 දිනට, ශේෂ පිරික්සුම පහත පරිදි වේ: (රු.)

| | හර | බැර |
|---|---|---|
| 2023 අප්‍රේල් 01 දිනට, ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 1,000,000) | | 10,000,000 |
| 2023 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 13,550,000 |
| අයදුම් සහ විභජන ගිණුම - හිමිකම් නිකුතුව | | 4,000,000 |
| **පිරියත සහ උපකරණ, පිරිවැයට:** | | |
| යන්ත්‍ර | 7,000,000 | |
| මෝටර් වාහන | 5,500,000 | |
| **2023 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| යන්ත්‍ර | | 2,600,000 |
| මෝටර් වාහන | | 2,000,000 |
| තොගය | 1,425,300 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 16,524,500 | 6,900,000 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 26,444,300 | |
| 2023 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 430,000 |
| ගෙවූ අතුරු ලාභාංශ | 2,000,000 | |
| විකුණුම් | | 57,645,000 |
| විකුණුම් පිරිවැය | 32,375,000 | |
| වැටුප් සහ වේතන | 3,530,000 | |
| කාර්යාල නඩත්තු වියදම් | 200,000 | |
| විකුණුම් කොමිස් | 450,000 | |
| ප්‍රචාරණ වියදම් | 316,000 | |
| විදුලිය | 675,000 | |
| ජලය | 125,000 | |
| ප්‍රවාහන සහ ගමන් වියදම් | 205,900 | |
| බැංකු ගාස්තු | 84,000 | |
| කාර්යාල කුලිය | 1,170,000 | |
| ගෙවූ ආදායම් බදු | 900,000 | |
| යන්ත්‍ර ඉවත්කිරීමේ ගිණුම | | 1,800,000 |
| | **98,925,000** | **98,925,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) පිරියත සහ උපකරණ, සරල මාර්ග ක්‍රමයට, පිරිවැය මත ක්ෂය කරනු ලබන අතර, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| යන්ත්‍ර | වර්ෂ 5 |
| මෝටර් වාහන | වර්ෂ 4 |

(2) 2022 ජූලි 01 දින, රු.2,100,000/- කට මිලදී ගත් යන්ත්‍රයක් 2024 ජනවාරි 01 දින රු.1,800,000/- කට විකුණන ලද අතර, විකිණීමෙන් ලද සම්පූර්ණ මුදල, යන්ත්‍ර ඉවත් කිරීමේ ගිණුමට බැර කරන ලදී. මේ සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොමැත.

(3) පහත සඳහන් වියදම්, 2024 මාර්තු 31 දිනට ගිණුම් පොත්වල ගිණුම්ගත කර නොමැත:

| | රු. |
|---|---|
| ඉදිරියට ගෙවූ කුලිය | 90,000 |
| 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණන ගාස්තු | 80,000 |

(4) 2024 ජනවාරි 31 දින, සමාගම විසින් එහි සියලුම සාමාන්‍ය කොටස්හිමියන්ට හිමිකම් නිකුතුවක් සිදුකර ඇති අතර, 2023 අප්‍රේල් 01 දින පැවති සෑම කොටස් දෙකකටම එක් කොටසක් බැගින් කොටසකට රු.8/- බැගින් නිකුත්කොට ඇත. සියලුම කොටස්හිමියන් හිමිකම් නිකුතුව ලබාගෙන ඇති අතර, වර්ෂය තුළදී සියලුම කොටස්හිමියන්ගෙන් මුදල් එකතු කරගෙන ඇත. මුදල් ලැබීම්, අයදුම් සහ විභජන ගිණුම - හිමිකම් නිකුතුවට බැරකර ඇත.

(5) 2023/24 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම් බදු වගකීම රු.2,150,000/- ක් වන අතර, එයින් රු.900,000/- ක මුදලක්, වර්ෂය තුළදී කාර්තුමය වාරික වශයෙන් ගෙවා ඇත.

(6) 2023 දෙසැම්බර් 31 දින කොටසකට රු.2/- බැගින් වූ අතුරු ලාභාංශයක් සමාගම විසින් ගෙවා තිබේ.

(7) 2024 මාර්තු 31 දිනට පැවති වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා වන ප්‍රතිපාදනය, 10% ක් ලෙස පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

(8) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2024 ජූනි 30 දින ලබා දී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත Everbright (පෞද්ගලික) සමාගමේ** කළමනාකාරීත්වයේ භාවිතය සඳහා, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ/ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 14)

(b) 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 11)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අදින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |